# ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
## தேசியக் கொள்கைகள் மற்றும் பொருளாதார விவகாரங்கள் அமைச்சு
## Ministry of National Policies and Economic Affairs

"මිලෝදා" (පැරණි ටයිම්ස් ගොඩනැගිල්ල), පළමු මහල, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01. "மிலோதா", (பழைய டைம்ஸ் கட்டிடம்) 1 ஆம் மாடி, பிரிஸ்டல் வீதி, கொழும்பு 01. "Miloda" (Old Times Building), 1st Floor, Bristol Street, Colombo 01.


මගේ අංකය / எனது இல. / My No. MNPEA/YAD/04/ යො.පු. – 2018    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2018.01. 12

චක්‍රලේඛ අංක - MNPEA 01/2018

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත

**<u>යොවුන්පුරය ජාතික වැඩසටහන 2018 - නිකවැරටිය</u>**

ගරු අග්‍රාමාත්‍යතුමාගේ මගපෙන්වීම යටතේ ජාතික සංවර්ධනයට තරුණ ප්‍රජාවගේ දායකත්වය මැනවින් ලබා ගැනීම සඳහා ඔවුන් තුළ නායකත්ව ගුණාංග, කුසලතා හා දැනුම වර්ධනය කොට ජාත්‍යන්තර තලයට ඔසවා තැබීම අරමුණු කරගෙන තරුණ තරුණියන්ගේ දායකත්වයෙන් යොවුන්පුරය ජාතික වැඩසටහන මෙම වසරේදීත් පැවැත්වීමට තීරණය කර ඇත. ඒ අනුව මෙම ජාතික වැඩසටහන ශ්‍රී ලාංකීය තරුණ තරුණියන් 7000 කගේ සහ විදේශීය තරුණ නියෝජිතයන් 100 කගේ සහභාගීත්වයෙන් 2018.03.28 වන දින සිට 2018.04.01 වන දින දක්වා ජාතික තරුණ සේවා සභාව හා ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය එක්ව නිකවැරටිය, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් භූමි භාගයේ දී පැවැත්වීමට කටයුතු සැලසුම් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් වූ විශේෂ සාකච්ඡාවක් 2018.01.08 වන දින නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය හා අග්‍රාමාත්‍ය කාර්ය මණ්ඩල ප්‍රධානි ගරු සාගල රත්නායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු නිරෝෂන් පෙරේරා මැතිතුමන්, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී.

03. එම රැස්වීමේදී කරන ලද නියමයන් පරිදි යොවුන්පුරය ජාතික වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා පූර්ව සූදානම් කටයුතු සම්බන්ධයෙන් සහ වැඩසටහන පැවැත්වෙන දිනවලදී අදාළ අමාත්‍යාංශ/පළාත් සභා, දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ/ පළාත් සභා යටතේ ඇති ආයතනවල පූර්ණ දායකත්වය ලබා දෙන ලෙසටත් ඒ සඳහා වන පිරිවැය ඒ ඒ අමාත්‍යාංශ/පළාත් සභා, දෙපාර්තමේන්තුවලට හා ආයතනවලට 2018 වසර සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් ඉටුකර දෙන ලෙසටත් උපදෙස් දෙන ලදී.

04. ඒ අනුව, මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ අමාත්‍යාංශය/පළාත් සභාව වෙතින් මෙන්ම ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතනවලින් අපේක්ෂිත කාර්යභාරයන් නියමිත දින වකවානුවලදී ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර
ලේකම්

පිටපත්

01. ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.පි.
02. අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.පි.
03. අමාත්‍ය මණ්ඩල ලේකම් - කරු. දැ.ගැ.පි.
04. විගණකාධිපති - කරු. දැ.ගැ.පි.


දුරකථන / தொலைபேசி / Telephone: 011- 4461500
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2322867, 011 - 2339732
Website: www.mnpea.gov.lk



Scanned by CamScanner